# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

ඩබ්ලිව්. ඒ. සුසිල් ආරියවංශ,
අංක 22 A, ජයන්ති ග්‍රාමය,
සාලියපුර.

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය : 824/2021**

එදිරිව

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
සර්. චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,
කොළඹ 02.

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක දු:ක අංක 071-1930361 ඔස්සේ පෙනී සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් ආර්.එස් ගජේන්ද්‍රා මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, වානිජ හා ආයතනික කළාප 01 (තොරතුරු නිලධාරි), කේ.එම් ප්‍රදීප් මහතා, ප්‍රධාන ඉන්ජිනේරු, බී 05, කේ.කේ.ආර්.එස් රණවීර මහතා, සහකාර විදුලි ඉන්ජිනේරු, කළාප 01 පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නොමැත.
පොදු අධිකාරිය - 2021.12.15

**විභාග කළ දිනය** : 2022.04.06

**තීරණය කළ දිනය** : 2022.04.06

**<u>කොමිෂන් සභාවේ තීරණය :</u>**

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2021.06.28 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"අමුණා ඇති පාරිසරික ආරක්ෂක බලපත්‍රය හිමි 'දසුන් මෝටර්ස්', ජයන්ති ග්‍රාමය, සාලියපුර.*

*මෙම ගරාජයට ලබාගෙන ඇත්තේ,*

1. *එකලා විදුලි සැපයුමක් ද?*
2. *තෙකලා විදුලි සැපයුමක් ද? යන වග දැන ගැනීම"*

තොරතුරු නිලධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2021.08.04 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරි ද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2021.09.11 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් 2021.12.15 දිනැතිව කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කරමින් ලිපියක් එවා ඇති අතර එහි පහත කරුණු දක්වා ඇත.

*"………… බාහිර පාර්ශවයකට අයත් තොරතුරක් වන බැවින් පනතේ 5 වන වගන්තියේ විධිවිධාන අනුව W.A. සුසිල් ආරියවංශ මහතා වෙත තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරමින් තොරතුරු නිලධාරී - බෙදාහැරීම් අංශ 1 විසින් 2021.07.07 දිනැති ලිපිය යොමු කර ඇත.*

*තොරතුරු ලබා නොදීම පිළිබඳව සඳහන් කළද අදාල තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේපිත ලිපිය ඔහු වෙත යවා ඇති අතර එහි පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමග ඉදිරිපත් කරමි."* යනුවෙනි.

**සලකා බැලීම**

පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු කිසිවක් පනතේ 05 වන වගන්තියේ සීමා කිරීම් වලින් ආවරණය නොවේ. අභියාචකගේ තොරතුරු ඉල්ලීමට නිසි ප්‍රතිචාර දැක්වීමට පොදු අධිකාරිය අසමත් වී ඇත. නම් කළ නිලධාරි විසින් අභියාචනය සඳහා ප්‍රතිචාර නොදැක්වීම පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීමකි. අභියාචක විසින් ඉල්ලා ඇති උක්ත තොරතුර ඉතාමත් සරළ තොරතුරක් වන අතර විදුලිය පිළිබඳ සාමාන්‍ය දැනුමක් ඇති ඕනෑම පුද්ගලයෙකුට අදාළ විදුලි කණුව සහ සැපයීම ලබා දී ඇති ස්ථානය නිරීක්ෂණය කිරීමෙන්ද ලබා ගත හැකි තොරතුරකි. එවැනි තොරතුරක් කිසිදු අයුරකින්වත් පෞද්ගලික තොරතුරක් හෝ තුන්වන පාර්ශවයක තොරතුරක් කළ නොහැක.

මෙම කරුණු සළකා බලා ඉහත නම් සඳහන් අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2021.06.28 දිනැති තොරතුරු ඉල්ලීමේ අඩංගු තොරතුරු 2021.04.20 වන දින හෝ ඊට ප්‍රථම මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව අභියාචක වෙත සැපයීමට පොදු අධිකාරිය සහ එහි තොරතුරු නිලධාරින් ක්‍රියා කළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් 2022 මාර්තු 24 දිනෙන් පසුව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය යටතේ නියමිත මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නීති කෘතීන් ආරම්භ කිරීමට කොමිෂන් සභාව තීරණය කරයි.

මෙම නියෝගය අභියාචක වෙත, තොරතුරු නිළධාරි වෙත සහ පොදු අධිකාරිය වෙත දන්වා යැවීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනයට අවසර දෙන ලදී.